# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 77 — 1973 සැප්තැම්බර් 14 වැනි සිකුරාද — 1973.09.14

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (III) වැනි ඡේදය—වෙළඳ ලකුණු සහ පේටන්ට් බලපත්‍ර පිළිබඳ දැන්වීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටු | | පිටු |
|---|---|---|---|
| වෙළඳ ලකුණු පිළිබඳ දැන්වීම් ... ... | 183 | මෝස්තර ආඥපනත යටතේ නිවේදන — — | — |
| වෙළඳ ලකුණු පිළිබඳ නිවේදන ... ... | — | විවිධ දැන්වීම් ... — — — | — |
| පේටන්ට් බලපත්‍ර ආඥපනත යටතේ නිවේදන ... ... | — | | |


සැළකිය යුතුයි.—යුක්තිය පසිඳලීමේ පනත් කෙටුම්පත සහ ලංකා ඛනිජ තෙල් සංස්ථා (සංශෝධන) පනත් කෙටුම්පත 1973 සැප්තැම්බර් 07 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයන් වශයෙන් පළ කරන ලදී.

## වෙළඳ ලකුණු පිළිබඳ දැන්වීම්

### වෙළඳ ලකුණු පිළිබඳ කාර්යාලය

වෙළඳ ලකුණුවලට අදාල සියළුම ලියුම් කියුම් කොළඹ 1, ඇව්ලන් චතුරශ්‍රයේ 5 වැනි ගොඩනැගිල්ලේ වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර්ගේ දෙපාර්තමේන්තුවේ වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර් වෙත එවිය යුතුයි.

### පරීක්ෂා කිරීමේ වේලාවන්

සතියේ වරුවේ දින හැර සෑම ක්‍රියාකාරී දිනකම පෙරවරු නවයේ සිට පස්වරු තුන දක්වා ද, සෑම වරුවේ දිනවල පෙරවරු නවයේ සිට පෙරවරු එකොළහයි තිහ දක්වා ද, ලේඛන පරීක්ෂා කිරීම සඳහා මහජනයා වෙනුවෙන් කාර්යාලය විවෘත කර තබනු ලැබේ. පරීක්ෂා කිරීම සඳහා එවනු ලබන ඉල්ලුම් පත්‍ර ක්‍රියාකාරී දිනවල පස්වරු දෙක දක්වා ද, වරුවේ දිනවල පෙරවරු එකොළහ දක්වා ද, භාරගනු ලැබේ.

### වර්ණවලට සීමාවූ වෙළඳ ලකුණු

ලියාපදිංචි කරනු ලැබීමෙන් පසු වෙළඳ ලකුණක් යම් යම් වර්ණයන්ට සීමා කරනු ලබන බවට ඉල්ලුම් පත්‍රයක් පිළිබඳ දැන්වීමක සඳහන් වී ඇති කල්හි ඊ සමග ඉදිරිපත් කරනු ලබන වෙළඳ ලකුණේ ලාංඡනයෙහි හැකි තරම් දුරට එම වර්ණයන් සාමාන්‍යයෙන් ප්‍රචාරය වන අන්දමට දක්වනු ලැබේ.

### ආශ්‍රිත කිරීම

මෙහි පළ කර ඇති වෙළෙඳ ලකුණක් වෙළඳ ලකුණු ආඥපනතේ 23 වැනි වගන්තිය (150 වැනි පරිච්ඡේදය) යටතේ තවත් ලකුණක් හා ආශ්‍රිත කොට භාවිත කරනු ලබන බව සඳහන් කර ඇති කල්හි එම වෙළඳ ලකුණට දී ඇති අංකය ද දක්වනු ලැබේ.

### "ඒ" කොටසේ හෝ "බී" කොටසේ ඉල්ලීම්

රෙජිස්ටරයේ "ඒ" කොටසේ ලියාපදිංචි කිරීම සඳහා කරනු ලබන ඉල්ලීම් කිසිම අක්ෂරයක් නොමැතිව කාර්යාලයීය අංකය සමග දක්වනු ලැබේ. රෙජිස්ටරයේ "බී" කොටසේ ලියාපදිංචි කිරීම සඳහා කරන ඉල්ලීම් කාර්යාලයීය අංකයට මුලින් "බී" අක්ෂරය සහිතව දක්වනු ලැබේ.

සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ

### විශේෂ නිවේදනයයි

ඉදිරියට පළ වන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළ කිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළ කිරීමේ දින දැක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළ කර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ. කුමන හේතුවක් නිසාවත් ප්‍රමාදවී ලැබෙන දැන්වීම් භාරගනු නොලැබේ.

1971 මාර්තු 19 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

## විරෝධය දැක්වීම

**පහත සඳහන් වෙළඳ ලකුණු ලියාපදිංචි කිරීම පිළිබඳව විරුද්ධවීමට හේතු ඇති කවරකු විසින් හෝ මේ ගැසට් පත්‍රය පළ වන දින සිට දෙමසක් ඇතුළතදී රුපියල් 25ක අවලංගු නොකරන ලද හෝ ලාංඡිත මුද්දරයක්ද සමග ටී. ඇම්. 7 දරණ පෝර්ම මගින් විරෝධතා දැන්වීම ඉදිරිපත් කරන ලෙස මෙයින් දන්වා සිටිනු ලැබේ. රෙජිස්ට්‍රාර් විසින් සුදුසු යැයි සලකනු ලබතොත් විරෝධතා දැන්වීම ඉදිරිපත් කිරීමේ කාල සීමාව ඔහු විසින් නියම කරනු ලබන කොන්දේසි උඩ දීර්ඝ කරනු ලැබිය හැකිය.**

**ලියාපදිංචි කිරීම ඉල්ලුම් කර සිටින තැනැත්තාට තම ඉල්ලීම අස්කර ගන්නට අවස්ථාවක් සැලසෙනු පිණිස, විරෝධතා දැන්වීම පිළියෙල කිරීමේ වියදම් දැරීමට පෙර සෑහෙන ප්‍රමාණ කාලයක් දී ලියවිල්ලකින් දැන්වීමක් එකී ඉල්ලුම්කරු වෙත යවා මිස විධිමත් විරෝධතාවක් ඉදිරිපත් නොකළ හැකිය.**

**විරෝධතාවක් සම්බන්ධයෙන් ඉල්ලුම්කරු විසින් එරෙහිව කරුණු ඉදිරිපත් නොකළහොත් එසේ විරුද්ධ වන්නකු විසින් ගාස්තු අයකර ගැනීමේ නියෝගයක් සඳහා කරනු ලබන ඉල්ලීමක් ගැන සලකා බැලීමේදී යට කී පරිදි දැන්වීමක් යැවීමේ කාර්ය පැහැර හැර තිබීම ද සැළකිල්ලට ගනු ලැබේ.**

---

(1) වෙළඳ ලකුණේ අංකය: 34,992. (2) ලැබුණ දිනය: 1973 පෙබරවාරි 02 වැනි දින. (3) ඉල්ලුම්කරු (වෙළඳ ලකුණ අයිතිකරු): රියියෝ ටුබැකෝ කෝපරේෂන් ඔෆ් නිව්යෝර්ක් ලිමිටඩ් (නිව්යෝර්ක් රාජ්‍යයේ නීති යටතේ සංස්ථාපිතව පවත්වාගෙන යනු ලබන සමාගමකි) නිව්යෝර්ක්, ඇමරිකා එක්සත් ජනපදය; නිෂ්පාදකයෝ සහ වෙළෙන්දෝ. (4) ලියුම් භාරදීම සඳහා මෙරටෙහි වූ ලිපිනයක් ඇත්නම් ඒ ලිපිනය: එෆ්. ජේ. හා ජී. ද සේරම් මහතුන්, තැ. පෙ. 212, කොළඹ. (5) පන්තිය: 45. (6) බඩු: 45 වන පන්තියට අයත් සියලුම භාණ්ඩ. (7) වෙළඳ ලකුණේ සටහන:




මෙම වෙළඳ ලකුණ අංක 24,069 දරණ ලකුණ හා ආශ්‍රිත කරනු ලැබේ.

වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ,
1973 මාර්තු 08 වැනි දින.

ආර්. එල්. ද සිල්වා,
වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර්.

9-456—73.09.14 දින අංක 77 දරන ගැසට් පත්‍රය

---

(1) වෙළඳ ලකුණේ අංකය: 32.880. (2) ලැබුණ දිනය: 1970 ජූලි මස 29 දින. (3) ඉල්ලුම්කරු (වෙළඳ ලකුණ අයිතිකරු): ප්‍රෑඇක්ටන් කොස්මෙටික්ස් පීටීවයි. ලිමිටඩ් (ඕස්ට්‍රේලියාවේ, වික්ටෝරියා රාජ්‍යයේ නීති යටතේ සංවිධානයව පවත්වාගෙන යනු ලබන සමාගමකි) අංක 382 වයිට්හෝස් පාර, නනවේඩිං වික්ටෝරියා, 3131, ඕස්ට්‍රේලියාව; නිෂ්පාදකයෝ සහ වෙළෙන්දෝ. (4) ලියුම් භාරදීම සඳහා මෙරටෙහි වූ ලිපිනයක් ඇත්නම් ඒ ලිපිනය: එෆ්. ජේ. හා ජී. ද සේරම් මහතුන් තැ. පෙ. 212, කොළඹ. (5) පන්තිය: 48. (6) බඩු: සුවඳ ද්‍රව්‍ය, ඊතරීය සහ වාෂ්පශීලී තෙල්, සබන්, කෙස් පිරිසිදු කිරීමේ සහ දත් පිරිසිදු කිරීමේ කාරක. (7) වෙළඳ ලකුණේ සටහන:

**P R U E   A C T O N**

ආර්. එල්. ද සිල්වා,
වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර්.

වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ,
1973 පෙබරවාරි මස 10 දින.

9-457—73.09.14 දින අංක 77 දරන ගැසට් පත්‍රය

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊලඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහාලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය.

**සැ.යු.**—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරි වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

උපලේඛනය

**1973**

| මාසය | පළකිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | | |
|---|---|---|---|---|---|---|
| සැප්තැම්බර් | 73.09.07 | සිකුරාද ... | 73.08.31 | සිකුරාද | දවල් | 12.00 |
| | 73.09.14 | සිකුරාද ... | 73.09.07 | සිකුරාද | දවල් | 12.00 |
| | 73.09.21 | සිකුරාද ... | 73.09.14 | සිකුරාද | දවල් | 12.00 |
| | 73.09.28 | සිකුරාද ... | 73.09.21 | සිකුරාද | දවල් | 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 ඔක්තෝබර් මස 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.